www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉරාක ව්‍යවස්ථාව පිළිබඳ ජනමත විචාරනය ප්‍රජාතන්ත්‍රවාදයේ ව්‍යාජයක් බවට පත් වෙයි

## Iraq's constitutional referendum makes a mockery of democracy

**පීටර් සිමන්ඩ්ස් විසිනි**
**2005 ඔක්තෝබර් 6**

ඔක්තෝබර් 15 දා පැවැත්වීමට නියමිත ඉරාක ව්‍යවස්ථා කෙටුම්පත පිලිබඳ ජනමත විචාරනය නිෂ්ඵල ක්‍රියාවක් බවට හැරී ඇත. සාධනීය ප්‍රතිඵලයක් අපේක්ෂාවෙන්, එක්සත් ජනපදයේ පිටුබලය සහිත කුර්ද් හා ෂියායිට් මූලධර්මවාදී පක්ෂවල පාලක සභාගය පසු ගිය ඉරිදා එරට මැතිවරන නීතිය සංශෝධනය කලේ ය.

මූලිකව කුර්ද් පක්ෂවල සහයෝගය සහතික කර ගැනීමේ අටියෙන් එක්සත් ජනපද නිලධාරීන් විසින් 2003 දී සකස් කරන ලද සංක්‍රමන නීතිය යටතේ පලාත් තුනක තුනෙන් දෙකේ බහුතරය නැත කියා ඡන්දය පාවිච්චි කල හොත් ජනමත විචාරනය පරාජයට පත් වේ. ව්‍යවස්ථා ලියවිල්ල ප්‍රතික්ෂේප කිරීමට හැකි වන සේ ඡන්දය සඳහා ලියාපදිංචි වන ලෙසත් ව්‍යවස්ථාවට එරෙහිව ඡන්දය පාවිච්චි කරන ලෙසත් සුන්නි සංවිධාන හා පක්ෂ තම ආධාරකරුවන් උනන්දු කරවමින් සිටියි.

එවැනි ප්‍රතිඵලයක් බැග්ඩෑඩ් තන්ත්‍රයට පමනක් නො ව ජනමත විචාරනය හා දෙසැම්බර් මැද පැවැත්වීමට සැලසුම් කොට ඇති ජාතික මැතිවරනය හරහා තම ආක්‍රමනය යුක්තිසහගත කිරීමට මාන බලන බුෂ් පරිපාලනයට ද ව්‍යසනයක් වනු ඇත. ජනමත විචාරනය පරාජයට පත් වුව හොත් හා සංක්‍රමන නීතිය අනුගමනය කරනු ලැබුව හොත් සිදු වන්නේ කලින් තිබූ තත්වය තුල ම කොටු වීම යි. එනම් නව මැතිවරනයක්, නව ආන්ඩුවක්, නැවත ලියන ලද ව්‍යවස්ථාවක් හා එය ද පිලිගනී යැයි සහතිකයක් නොමැති නව ජනමත විචාරනයක් කරා යාම යි.

*රොයිටර්* පුවත් වෙත අදහස් දක්වමින් ලන්ඩනයේ කිංග්ස් කොලීජියේ ආරක්ෂක විශ්ලේෂක මාටින් නවයියාස් කීවේ: "මෙම ජනමත විචාරනය පරාජය වීමෙන් ඇති වන ඵලවිපාක අතිවිශාල ය; ඒවා සිතීමට පවා බියජනක ය. මෙම ජනමත විචාරනය පරාජය වුව හොත් එය සමස්ත දේශපාලන ක්‍රියා දාමය ම පැහැදිලි ලෙස ප්‍රතික්ෂේප කිරීමකි. එය අසාර්ථක වීමට ඉඩ දිය නොහැකි ය" යන්නයි.

එම නිසා ජනමත විචාරනයට "ඔව්" කියා ඡන්දයක් ලබා ගැනීමේ අටියෙන් ලජ්ජා රහිතව වංචාසහගත ඡන්දයක් පැවැත්වීමට ඉරාක ජාතික සභාව ඡන්දය දීම පුදුමයට කරුනක් නො වේ. සංශෝධිත නීති යටතේ ජනමත විචාරනය පරාජය කිරීමට පලාත් තුනක **ලියාපදිංචි** ඡන්ද දායකයන්ගෙන් තුනෙන් දෙකක බහුතරයක් අවශ්‍ය වේ. වෙනත් වචනවලින් කියතොත් ඡන්දය දුන් සංඛ්‍යාව තුනෙන් දෙකක් හෝ සියයට 67ක් නො වුන හොත් ව්‍යවස්ථා ලියවිල්ල පරාජය කිරීම කල නොහැකි වනු ඇත. වඩාත් සිත් ගන්නාසුලු කරුන වන්නේ ව්‍යවස්ථා පිලිගැනීමට එම අර්ථනිරූපනය භාවිත නො වී ඡන්දය දුන් අයගෙන් සරල බහුතරයක් පමනක් අවශ්‍ය වීම යි.

සංශෝධනයක් හොර රහසේ සම්මත කර ගැනීමට ආන්ඩුව ගත් උත්සාහය නො තකා මෙම සංශෝධනයන් ආපසු හකුලා නො ගත හොත් ඡන්දය වර්ජනය කිරීමට කැඳවුම් කරමින් සුන්නි නායකයෝ කෝපාන්විතව ප්‍රතිචාර දැක්වූහ. සුන්නිවරුන් අඩු ප්‍රමානයක් ඡන්දය පාවිච්චි කල හොත් එමගින් මැතිවරනයේ සුජාත භාවයට තව දුරටත් වල කැපෙනු ඇතැයි බිය වූ එක්සත් ජාතීන්ගේ හා එක්සත් ජනපද නිලධාරීහු නව නීති විවේචනය කලහ. එහි ප්‍රතිඵලයක් ලෙස ජාතික සභාව සංශෝධන හකුලා ගැනීමට ඊයේ ඡන්දය දුන්හ.

සුන්නි ඡන්ද බෙදීමට එක්සත් ජනපද තානාපති සැල්මේ ඛලිල්සාද් තිරයෙන් පිටුපස සිට ගත් උත්සාහයන් ව්‍යර්ථ කිරීම සඳහා මෙම උද්ඝෝෂනයෙන් බලපෑම් ඇති විය. තෙල්වලින් පොහොසත් උතුරේ කුර්ද් ප්‍රදේශයේ හා දකුනේ ෂියායිට් ප්‍රදේශයේ තෙල් ආදායම් හා ආරක්ෂක හමුදාවල පාලනය ද ඇතුලත් පුලුල් බලතල සහිත ප්‍රාදේශීය ආන්ඩු ස්ථාපනය කිරීමට මග හෙලි කරන ව්‍යවස්ථා ලියවිල්ලේ අඩංගු ෆෙඩරල් ව්‍යුහයට සුන්නි සංවිධාන විරුද්ධ වෙයි. මෙම ව්‍යුහයට අනුව සුන්නිවරුන් ප්‍රමුඛ වන මධ්‍යම හා බටහිර පලාත්වලට සම්පත් හා බලතල අඩු වනු ඇත.

*වොෂින්ටන් පෝස්ට්* පුවත්පතේ පල වූ ලිපියකට අනුව, ව්‍යවස්ථාවට සංශෝධන ලෙසින් සුන්නිවරුන්

කරන ඉල්ලීම් පිලිගන්නා ලෙස ෂියයායිට් හා කුර්ද් නායකයන් ඒත්තු ගැන්වීමට බලිල්සාද් උත්සාහ දරමින් සිට ඇත. සැලසුම් කර ඇති ෆෙඩරල් ව්‍යුහයට කිසිදු වෙනස්කමක් කිරීම සාකච්ඡාවට නොගැනීමට පාලක සභාගය තීරනය කිරීමෙන් පසු මේ දක්වා සාකච්ඡා ඇන හිට ඇත. ''අන්‍යෝන්‍ය අවබෝධයක් කරා ලඟා වීමට උපකාර වන වෙනස්කම්වලට අපගේ විරුද්ධත්වයක් නැත. නමුත් ව්‍යවස්ථාවේ මූලික මූලධර්ම වෙනස් කිරීමට අපට එකඟ විය නොහැකි ය'' යි ෂියායිට් සාකච්ඡාකරු අලි ඩෙබාග් ප්‍රකාශ කලේ ය.

මෙම ජනමත විචාරනය ඉරාකය තුල ප්‍රජාතන්ත්‍රවාදය දෙසට තවත් පියවරක් යැයි බුෂ් පරිපාලනය කරන ප්‍රකාශය විවිධ පිලිකුල්සහගත උපාමාරු මගින් හාස්‍යයක් බවට පත් කෙරේ. එක්සත් ජනපද භටයන් 146,000කට වැඩි පිරිසක් රට තුල රැඳී සිටීම ද ආක්‍රමනයට විරුද්ධ වන්නන්ට එරෙහිව කර ගෙන යන මෙහෙයුම් ද කිසිදු ප්‍රජාතන්ත්‍රවාදී ඡන්දයක් පැවැත්වීමේ හැකියාව ඉවත් කර දමයි.

ඇමරිකානු ආක්‍රමනයට විරුද්ධ අතිමහත් බහුතරයක් සිටින බටහිර අන්බාර් පලාත තුල එක්සත් ජනපද මිලිටරිය ප්‍රධාන ආක්‍රමනයන් කර ගෙන යමින් සිටී. රිවර්ගේට් ක්‍රියාන්විතයේ (ඔපරේෂන් රිවර් ගේට්) කොටසක් ලෙස ඇමරිකානු භටයෝ 2,500ක් පමන ඉරාක හමුදා සමග හදිකා, හත්ලානියා හා බර්බානා නගරවලට පසු ගිය සඳුදා කඩා වැදුනහ.

යුප්‍රටීස් ගංගාව මතින් වැටෙන පාලම් විනාශ කරමින් ද විදුලි බලය ඇන හිටුවමින් ද සන්නද්ධ හෙලිකොප්ටර හා එක්සත් ජනපද යුද්ධ යානා නගර මතට පූර්ව ප්‍රහාර පතිත කලහ. සොල්දාදු කන්ඩායම් ගෙවල්වලට වැදී පදනම් විරහිත ලෙස ''ත්‍රස්තවාදී සැකකරුවන්'' රඳවා ගනිද්දී එක්සත් ජනපද ස්නයිපර් තුවක්කු වහලවල් මත සවි කොට වැසියන්ට නිවෙස් තුල රැඳී සිටින ලෙස ශබ්ද විකාශන යන්ත්‍ර මගින් අනතුරු හඟවනු ලැබිනි.

''අයන් ෆිස්ට් ක්‍රියාන්විතය'' (ඔපරේෂන් අයන් ෆිස්ට්) නම් තවත් එවැනි ම ප්‍රහාරයක් සිරියානු දේශ සීමාව ආසන්නයේ පිහිටි සාදාකරබිලා හා රුමානා නගරවල සෙනසුරාදා ආරම්භ විය. සැන් ෆ්‍රැන්සිස්කෝ ක්‍රෝනිකල් පුවත්පතේ ලිපියක් විස්තර කලේ, අවුරුදු 11ක තරම් වයසේ පසු වන දරුවන් පවා එක්සත් ජනපද හමුදා ස්ථාන පෙන්වමින් විරුද්ධ සටන්කාමීන්ට උදව් කල මුහුනට මුහුනලා කෙරුනු සටනක් පැවති බව යි. කැරලිකරුවන් රැඳී සිටී ය යි සැක කල ගොඩනැගිල්ලකට එක්සත් ජනපද යුද ටැංකියක් වෙඩි තැබීමෙන් අවම වසයෙන් සිවිල් වැසියන් 5 දෙනෙකු මරා දැමුනි.

රාවා නගරය සියතට ගැනීමට එක්සත් ජනපදය දැරූ උත්සාහයන් පිලිබඳව විග්‍රහ කරමින් නිව් යෝක් ටයිම්ස් පුවත්පතේ පල වූ වාර්තාවක් එක්සත් ජනපද ආක්‍රමනයට එරෙහිව පැතිර පවත්නා විරුද්ධත්වය පෙන්නුම් කලේ ය. 20,000ක ජනගහනයක් සහිත රාවා නගරය "බාත්වාදී බලකොටුවක්" ලෙස විග්‍රහ කරමින් එක්සත් ජනපද නිලධාරීහු නගරවැසියන්ගෙන් තමන්ට ලැබී ඇත්තේ "සුලු සහායක්" යැයි නො වලහා පිලිගත්හ. ජූලි මාසයේ පසු භාගයේ පටන් එක්සත් ජනපද හමුදාවන්ට මාර්ග බෝම්බ දුසිම් දෙකකින් හා මරා ගෙන මැරෙන මෝටර් රථ බෝම්බ අටකින් ප්‍රහාර එල්ල වී ඇති අතර ඔවුන් එයට ප්‍රතිචාර දක්වා ඇත්තේ ගුවන් ප්‍රහාර, මාර්ග බාධක හා නිවසින් නිවසට කරන සෝදිසි කිරීම් මගිනි.

නගරයට එල්ල වූ අවසන් ගුවන් ප්‍රහාරයෙන් පසුව, සෝදිසි කිරීම් හා රඳවා ගැනීම් පිලිබඳව උරන වූ 300ක සෙනඟක් අමතා එක්සත් ජනපද කර්නල් ස්ටීවන් ඩේවිස් හා ඔහුගේ ඉරාක සගයා වන යසර් කතා කලහ. ජනමත විචාරනයේ දී ඡන්දය දෙන ලෙස යසර් එම සෙනඟ උනන්දු කලේ ය. එක්සත් ජනපද භටයන් වෙත එල්ල කරන ප්‍රහාර දිගට ම කෙරී ගෙන ගිය හොත් තව තවත් පලි ගැනීම්වලට මුහුන දීමට සූදානම් වන ලෙස ඩේවිස් තියුනු ලෙස නගරවැසියන්ට අනතුරු හැඟවී ය. "ඔබලාගෙන් සමහරෙක් ප්‍රහාරක ගුවන් යානා හා (එක්සත් ජනපද) කඳවුරුවලින් එල්ල වන මෝටාර් ප්‍රහාර පිලිබඳව සැලකිලිමත් වෙති. මම ඔබට කියන්නේ ඒවා සාමයේ හඬවල් බව යි," ඔහු ප්‍රකාශ කලේ ය.

## දේශපාලනික අවිනිශ්චිතතාව

වැසියන් "විදේශීය ත්‍රස්තවාදීන්"ගෙන් නිදහස් කර ගැනීම වෙනුවට මෙම එක්සත් ජනපද ක්‍රියාන්විතවල එල්ලය වන්නේ ඇමරිකානු රැඳී සිටීමට විරුද්ධ ජනතාව ත්‍රස්ත කිරීම හා බිය ගැන්වීම යි.

ආක්‍රමන යටතේ තමාගේ ම ස්ථානය ශක්තිමත් කර ගැනීම සඳහා මහජන මනෝගතිය ගසා කැමට යත්න දරමින් සිටින සුන්නි නායකයෝ එක්සත් ජනපද ප්‍රහාර අවසන් නො කල හොත් ඡන්දය වර්ජනය කිරීමට තර්ජනය කර ඇත. සුන්නි ජාතික සංවාද සභාවේ සලේ-අල්-මුට්ලැක් ඊයේ ප්‍රකාශ කල පරිදි: "සුන්නි නගරවලට ප්‍රහාර එල්ල කිරීම එක්සත් ජනපද හමුදා දිගට ම කර ගෙන ගිය හොත් එවිට දින තුනක හෝ හතරක කාලයක් තුල ජනමත විචාරනය වර්ජනය කිරීමක් අපි නිවේදනය කරන්නෙමු."

"ඔව්" කියා ඡන්දයක් ලබා ගැනීම සඳහා එක්සත් ජනපදය යොදන රාජ්‍ය තාන්ත්‍රික හා මිලිටරි දඟිරිය මධ්‍යයේ වුව ද ජනමත විචාරනයේ ප්‍රතිඵලය කිසිදු ආකාරයකින් නිශ්චිත නැත. ජනවාරියේ පැවති ජාතික මැතිවරනය වර්ජනය කල සුන්නි සංවිධාන ජනමත

විචාරනය සඳහා ලියාපදිංචි වී එයට විරුද්ධව ඡන්දය දෙන ලෙස තම ආධාරකරුවන් අතර තීව්‍ර ලෙස උද්ඝෝෂනය කර ඇත. සමහර සුන්නි ප්‍රදේශවල ලියාපදිංචි වූවන්ගේ ප්‍රමානය දැනට ම සියයට 80 ඉක්මවා ඇතැයි එක්සත් ජනපද නිලධාරීන් ද පෞද්ගලික සංවිධාන ද පවසන බැව් නිව් යෝක් ටයිම්ස් පුවත්පත කියයි. එක් පෙන්ටගන නිලධාරියෙකු පුවත්පතට කී පරිදි, "අන්බාර් ප්‍රදේශයේ පරාජය පිලිබඳව කිසිවෙකු පුදුම නොවනු ඇත, සමහර විට තවත් පලාතක එසේ විය හැකි ය." "(එලෙස ම) අපට පලාත් තුනක් අහිමි විය හැකි ය."

ව්‍යවස්ථාව සම්මත වුවත් සමස්ත ක්‍රියා දාමයම අවජාතක ලෙස පුලුල්ව දැක ගනු ඇත. පසු ගිය සතියේ එක්සත් ජනපද කොන්ග්‍රසය හමුවේ කතා කල ඉරාකයේ එක්සත් ජනපද ජ්‍යෂ්ඨ අන දෙන නිලධාරි ජෙනරාල් ජෝර්ජ් කේසි කීවේ ජනමත විචාරනය ජය ගනු ඇතැයි තමන් විශ්වාස කරන බව යි. කෙසේ වුව ද, ඡන්දයෙන් පසුව දේශපාලන තත්වය වඩාත් නරක් වනු ඇත් දැයි ඇසූ කල ඔහු ප්‍රකාශ කලේ: "මම හිතන්නේ එය සම්පූර්නයෙන් ම එසේ වේවි කියලා. මම කියන්නේ අප සලකා බලා තිබෙන පරිදි ව්‍යවස්ථාව ජාතික සම්මුතියක් වනු ඇතැයි අපි හිතනවා තමයි. එහෙත් ප්‍රත්‍යක්ෂ දෙය වන්නේ එය එසේ නො වේ ය කියා යි, සුන්නිවරුන් අතර මෙය විශේෂ යි."

කොන්ග්‍රසය හමුවේ පෙනී සිටි තවත් අයෙකු වන එක්සත් ජනපද මධ්‍යම අන දෙන ඒකකයේ ප්‍රධානී ජෙනරාල් ජෝන් අබිසේඩ් ප්‍රකාශ කලේ: "ජනමත විචාරනයෙන් ව්‍යවස්ථාව ජය ගැනීම මගින් අප සාමය හා සෞභාග්‍යය දෙසට ගමන් ගන්නවා ය යි අදහස් කෙරෙන්නේ නැහැ. ඉරාකය අසීරු ආරක්ෂක පරිසරයක් සහිත තැනක් බවට පත් වෙමින් තිබෙනවා.''

ජෙනරාල්වරුන් දෙදෙනා ම වක්‍රව ඉගි කලේ මිලිටරිය කැච්-22 උභතෝකෝටිකයට මුහුන දෙන බව යි. තමන්ගේ ලිඛිත ප්‍රකාශය තුල ජෙනරාල් කේසි සඳහන් කලේ, "කැරලිකාරිත්වයට තෙල් දමන හේතුන්ගෙන් එකක් වන ඒකාබද්ධ හමුදා ආක්‍රමනික හමුදාවක් ලෙස පවත්නා ජනමතය ඉවත් කිරීම සඳහා" එක්සත් ජනපද භටකායන් ප්‍රමානය අඩු කල යුතු බව යි. අවිනිශ්චිතතාව ඉහල නැගුනු කාල සීමාවක් තුල භටකායන් අඩු කිරීම සම්බන්ධයෙන් ප්‍රකාශ කිරීම වේලාසන වැඩි ය" යි කියමින්, මෙම වසරේ මාර්තු හා ජුලි මාසවලට නියම කොට තිබුනු භට සංඛ්‍යාව අඩු කිරීම සම්බන්ධිත ඔහුගේ පුරෝකථනයන්, ලබන වසරේ මැද භාගයට කල් දමමින් ඒ වන විට "තරමක සැලකිය යුතු" භටකායන් අඩු කිරීම් සිදු වනු ඇතැයි කියා ඒවායේ වැදගත්කම අවම කර දැක්වී ය.

එක්සත් ජනපද සොල්දාදුවන්ගේ තැන ගැනීමට ඉරාක භටයන් හා පොලීසිය පුහුනු කිරීමේ උත්සාහය අර්බුදයට ගොස් ඇතැයි කේසි පිලිගත්තේ ය. ඉරාක ආරක්ෂක හමුදාවල ප්‍රමානය සැලකිය යුතු 192,000ක් පමන වේ. නමුත් කේසි ප්‍රකාශ කල ආකාරයට "ස්වාධීන හැකියාවක්" ඇත්තේ කිහිප දෙනෙකුට පමනි. එක්සත් ජනපදය විසින් පුහුනු කරන ලද ඉරාක යුද හමුදා හා පොලිස් භටකා 120න් එක්සත් ජනපද හමුදා නොමැතිව ක්‍රියාත්මක විය හැකි භටකායන් තුනක් පමන ජුලි මාසය වන විට තිබූ නමුදු අද එම සංඛ්‍යාව එකක් දක්වා අඩු වී ඇත.

හේතුව අවබෝධ කර ගැනීම අසීරු නො වේ. බහුතරය හමුදාවන්ට සම්බන්ධ වී ඇත්තේ පවත්නා රැකියා විකල්පයන් අතලොස්සෙන් එකක් ආරක්ෂක හමුදා වීම හේතුවෙනි. ක්‍රියාකාරී සාමාජිකයන් සාමාජිකයන් නොවුනත් බොහෝ දෙනා එක්සත් ජනපද ආක්‍රමනයට එරෙහි සන්නද්ධ විරුද්ධත්වයට හිතවත් වන අතර සෙසු ඉරාක ජාතිකයන් සමග සටන් කිරීම ඔවුන්ට අවශ්‍ය නැත. ඒ අතර ම ඔවුහු පුලුල් ලෙස එක්සත් ජනපද ඉත්තන් ලෙස දැක ගනු ලබන අතර නිරන්තරයෙන් කැරලිකාරී ප්‍රහාරවල ඉලක්ක බවට පත් වෙති. මෙම එක්සත් ජනපද මිලිටරි "උපදේශකයන්" විසින් සටනට තල්ලු කල හොත් හැර බොහෝ දෙනා සටන් කිරීමට අකමැති වීම පුදුමයක් නො වේ.

ඉරාක ජනයාට බියජනක අත්දැකීමක්ව ඇති එක්සත් ජනපද නායකත්වය යටතේ සිදු වූ ආක්‍රමනය ඇමරිකානු භටයන්ට මඩ ගොහොරුවක් නිර්මානය කර ඇත. එය කිසි සේත් ම ඉරාක ජනතාවට සාමය හා ප්‍රජාතන්ත්‍රවාදය ගෙන ඒම ඉලක්ක කර නො ත් අතර ඒ වෙනුවට මැද පෙරදිග කලාපය තුල එක්සත් ජනපදයේ පුලුල් ආර්ථික හා මූලෝපායික අභිමතාර්ථයන්ගේ කොටසක් ලෙස ඉරාකය හා එහි අතිවිශාල තෙල් සම්පත් යටත් කර ගැනීම ඉලක්ක කර ගැනුනි. වොෂින්ටනය තම අරමුනු ලුහුබැඳ යාමේ දී වඩාත් කෲර මර්දන විධික්‍රමයන් යොදා, ගනිමින් සිටින බව ඔක්තෝබර් 15 දා පැවැත්වීමට නියමිත ප්‍රෝඩාකාරී ජනමත විචාරනය මගින් සැඟවිය නොහැකි ය.

© www.wsws.org